නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය - 2020

## සිංහල භාෂාව

## 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**09 - ඒකකය**

## <u>තිලමුට්ඨි ජාතකය</u>

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

(1) පන්සිය පනස් ජාතක පොතේ ඇතුළත් වන්නේ,

(1) මිනිස් චරිත පමණි (2) සත්ත්ව චරිත පමණි

(3) මිනිස් හා සත්ත්ව චරිතයි

(2) මෙම පොත රචනා කරන ලද්දේ ,

(1) ගම්පොල යුගයේදීය (2) කුරුණෑගල යුගයේ දීය

(3) කෝට්ටේ යුගයේදීය

(3) ' ඇයි තොප කුමට අවුදු ' මෙසේ විචාළේ,

(1) බ්‍රහ්මදත්ත රජතුමා ය (2) මහලු කාන්තාව ය

(3) දිසාපාමොක් ඇදුරු තුමා ය

(4) ශිෂ්‍යයා විසින් තල කන ලද වාර ගණන වූයේ

(1) තුනකි (2) දෙකකි (3) හතරකි

(5) බ්‍රහ්මදත්ත කුමාරයාට රජ සැප හිමි වුයේ,

(1) ශිල්ප ශාස්ත්‍ර මැනවින් ඉගෙනගත් නිසා ය

(2) වැරැද්දට ගුරුතුමා නිසි දඩුවම් දුන් නිසාය

(3) අමාත්‍යවරුන්ගේ ඉල්ලීම නිසා ය

(6) අතීතයේ රජවරුන්ට අනුශාසනයා කිරීමේ තනතුර හැඳින්වූයේ,

(1) උපරාජ යනුවෙනි (2) මහරාජ යනුවෙනි (3) පුරෝහිත යනුවෙනි

(2) (අ) කොටසේ පාඩමේ දැක්වෙන පදවලට සමාන තේරුම් ඇති පද (ආ) කොටසින් තෝරා තිත් ඉර මත ලියන්න.

| අ | | ආ |
|---|---|---|
| තිලමුට්ඨි | (1) | ඔවදන් |
| දිසාපාමොක් | (2) | දොරටුව |
| අවවාද | (3) | තනතුරු හා ගරු නම්බු |
| අනායාවත් | (4) | බඹදත් |
| වෛර | (5) | නොපිළිගත්හ |
| රාජ්‍යශ්‍රීය | (6) | අයුක්තියක් |
| වාසල | (7) | දිසාවට ප්‍රධාන |
| නොගිවිස්සාහ | (8) | ක්‍රෝධ |
| තරම් පදම් | (9) | තලමිට |
| බ්‍රහ්මදත්ත | (10) | රජ සම්පත් |

**(3) වරහන තුළ ඇති උක්ත පද යටින් ඉරක් අඳින්න.**

(i) බ්‍රහ්මදත්ත නම් රාජ කුමරා ( කෙනෙක් , කෙනෙකු ) ඇත්තාහ.

(ii) තල වලට ( මම , මා ) මිල දෙමි.

(iii) ( රජ්ජුරුවෝ , රජ්ජුරුවන් ) කුමරාට රාජ්‍යශ්‍රීය දුන්නාහ.

(iv) හික්වීමට කළ පාටවයට ( උත්තමයෝ , උත්තමයන් ) වෛර නො බඳිති.

(v) ( ආචාරී තොමෝ , ආචාරී තුමූ ) ආ පවත් කියා යැවූහ.